# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල

## රැකියා පුරප්පාඩු

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය වසර 18ක් වැනි කෙටි කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. කාර්යාල කාර්ය සහයක

**සුදුසුකම්** : අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම

**වැටුප් පරිමාණය** : PL 1 -2016 - රු.[24,750 -10x250 -10x270 -7x300 -15x330 – 37,000]

**වයස** : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 2. රියදුරු

උපරිම අවස්ථාවන් දෙකකදී අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය විෂයන් 6කින් සමත්වී තිබීම සහ අවම වශයෙන් ඉන් විෂයන් දෙකක් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම

**සහ**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබීම

**සහ**

රියදුරු බල පත්‍රය ලබා ගැනීමෙන් පසුව වසර 03ක රියදුරු සේවයේ පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (1 හෝ 2)**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබීම.

**සහ**

රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව වසර 03ක රියදුරු සේවයේ පළපුරුද්ද තිබීම

**සහ**

ප්‍රාථමික අර්ධ කුසලතා (PL-2) ප්‍රාථමික නුපුහුණු (PL -1) සේවා ගණයේ වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

❖ බර වාහන රියදුරු බලපත්‍රයක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැළකේ.

**වැටුප් පරිමාණය** : PL 3 -2016 Rs.[26,290 –10 x270 -10 x300 -10 x330– 12x350 – 39,490]

**වයස** : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම්** : මෙම පත්වීම් ස්ථිර පත්වීම් වේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**කොන්දේසි :**

**සියලුම අයදුම්කරුවන්,**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමේ හැකියාව පැවතිය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්,**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමඟ එවිය යුතු වේ. දැනටමත් රාජ්‍ය / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල, නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට 2024.06.27 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලළධාරී,**
**ජාතික රක්ෂණ භාර අරමුදල,**
**නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,**
**කොළඹ 02.**